එක්සත් ගොවි සංවිධානයේ ගරු සභාපති තුමා
දේශිය වී අලවි කර ගැනීමට නොහැකි බැවින් ගොවින් දැඩි අසිරුතාවයකට මුහුණ දී සිටින අතර හෙළ සුවය ආයතනය මේ පිළිබදව පියවරක් නොගන්නා බවත්
රාජාංගනය ව්‍යාපාරයෙන් ප්‍රමිතියෙන් අඩු බීජ ලබා දුන් බව ගොවිජනසේවා දෙපාර්තමේන්තු නිළධාරීන් පැවසීම මගින් එසේ බීජ ලබා දීම නිළධාරීන් දැනුවත්ව කිරීම ගොවින්ට කල අසාධාරණයක් බව පවසන ලදි.

ලිපි ඉදිරිපත් කිරීම
නෙළුම්වැව එකමුතු ගොවි සංවිධානයේ දෙවන අදියර යටතේ පදිංචි කල පිරිසට වන්දි ලබී නොමැති බව ඒ පිළිබද සාකච්ජාවක් 2020/10/09 දින පවත්වා තීරණයක් ලබා දීමට තීරණය විය.

2020/21 මාස් කන්නයේ තීරණ ඉඟිනිමිටිය රදවිබැඳි ඇල ව්‍යාපාරය.

ඒ අනුව ගොවි සංවිධාන නිළධාරීන්ගේද අදහසට අනුව 2020/21 මාස් කන්නය සදහා පහත තීරණ හා කොන්දේසි සුදුසු බවට සාරකෙත ගොවි සංවිධානයේ ගරු සභාපති ඒස්.ඩබ්ලිව්.චන්ද්‍රසේන මහතා යෝජනා කල අතර අරුණළු ගොවි සංවිධානයේ ගරු සභාපතිආර්.එස්.එම්.මුදියන්සේ මහතා විසින් ස්ථිර කරන ලදි.

| | |
|---|---|
| 2020/21 දිනට ජලාශයේ ජල තත්වය | - අක් අඩි 25503 (මුලු) |
| | - අක් අඩි 18503 (සක්‍රිය) |
| මහඋස්වැව ජලාශයේ ජල තත්වය | - අක් අඩි 2055 |
| ඌරියාව ජලාශයේ ජල තත්වය | - අක් අඩි 620 |

දින වකවානු

| | |
|---|---|
| ප්‍රථම ජල නිකුතුව | - 2020/10/8 |
| ඇළවේළි ශුද්ධ කිරීම | - 2020/9/25 ට පෙර |
| | 2020/9/25 න් පසු ශුද්ධ නොකල කොටස ගොවි සංවිධානය මගින් ශුද්ධ කිරීම |
| අදාළ වී වර්ගය | - මාස 3. 3½ |
| වපුරා අවසන් කිරීම | - 2020/10/31 |
| අවසන් ජල මුරය | -2021/01/31 |
| අස්වනු නෙලා අවසන් වීම | -2021/02/20 |

මේ පිළිබදව සැලකිල්ලට භාජනය වීමෙන් පසු ව්‍යාපාරයේ පවතින කලාප ක්‍රම වගා සැලැස්මට අනුව පහත තීරණ ගන්නා ලදි.

දිනවකවානු හා කොන්දේසි
වගා කරනු ලබන ප්‍රදේශය -
වම් ඉවුර පහළ කලාපය

| | |
|---|---|
| 1. 8 වන ගම්මානය එකමුතු ගොවි සංවිධානය | - අක් 425 |
| 2. 7 වන ගම්මානය කල්‍යාණමිත්‍ර ගොවි සංවිධානය | - අක් 602 |
| 3. 6 වන ගම්මානය අරුණළු ගොවි සංවිධානය | - අක් 660 |
| 4. ඌරියාව ගොවි සංවිධානය | - අක් 295 |
| | අක් 1982 |

දකුණු ඉවුර පහළ කලාපය

| | |
|---|---|
| 1. වෙලේවැව ගොවි සංවිධානය D 2 න් පහල කොටස | - අක් 480 |
| 2. සාරකෙත ගොවි සංවිධානය | - අක් 280 |
| 3. දිමුතු ගොවි සංවිධානය | - අක් 220 |
| 4. පුබුදු ගොවි සංවිධානය | - අක් 595 |
| | අක් 1575 |

එසේම වෙල්පහු ජලයෙන් රදවිබැදිඇළ කොටසද වගා කිරීමට -අක් 800

මුලු බිම් ප්‍රමාණය අක් 4357

කොන්දේසි

- තමන්ට අයිති ඇළවේලි සුද්ධ නොකිරීමේ දඩය බඹයකට රු 400.00 කි.
- වගා කරනු ලබන කොටස් වල සංවර්ධන අරමුදල් අක්කරයකට රු 400.00 කි. එය ගොවි සංවිධානයේ භාණ්ඩාගාරික විසින් අය කර බැංකු ගත කර නඩත්තු සැලැස්මක් සකස් කර මහසභා තිරණ අනුව නඩත්තු වැඩ කල යුතුය.
- වාරි පද්ධතිය.ඇළවේලි හා නිර්මිත වලට හානි කිරමේ දී රු 5000.00 ක් දඩයක් හා අලාභයේ තක්සේරු වටිනාකම ගෙවිය යුතු බවද.
- අවශ්‍ය අවස්ථා වලදී කන්න රැස්වීම් තීරණයන් විශේෂ ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීමක් පවත්වා එමගින් යෝජනා සකස් කර දිසාපතිතුමාගේ අනුමැතියට යටත්ව ක්‍රියාත්මක කිරීම.
- කන්නය තුළ ජල පාලනකමිටුවක් මගින් ක්‍රියාත්මක කරනු ලැබේ.
- කන්න රැස්වීම් තිරණ කඩ කරනු ලබන අවස්ථා වලදී ගොවිජන විනිශ්චය සභාව මගින් ගොවිජන සංවර්ධන පනතට අනුව කටයුතු කරන අතර ඒ පිළිබදව ගොවි සංවිධාන නේවාසික ව්‍යාපාර කාර්යාල හරහා ගොවිජන සේවා අංශයට වාර්තා කල යුතුය.
- අනවසර ජලය ලබා ගැනිම හා වාරිමාර්ග නිර්මිත වලට හානි කිරීම යන කරණු සදහා පොලිසිය මගින් නීතිමය කටයුතු කිරීමටත් තිරණය විය.
- ජලය ලබා ගැනිමේ දී දිගින් දිගටම අනවසරයෙන් ජලය ලබා ගන්නා ඇළවල් කොන්ක්‍රීට් කිරීම.

වාරිමාර්ග අධ්‍යක්ෂ- පුත්තලම

පුත්තලම වාරිමාර්ග අධ්‍යක්ෂතුමා විසින් කන්නය සාර්ථක කර ගැනිමට ගොවි සංවිධාන වල සහයෝගය ලබා දිය යුතු බවත් ඉගිනිමිටිය වැව් තාවුල්ලේ අනවසර වගාවන් පිළිබද අදහස් දක්වමින් තමා පසුගිය දිනක එම ස්ථානයට ගිය බවත් ඒ වන විට ජල පොම්ප 150 ක් පමණ ක්‍රියාත්මක බවත් එම අවස්ථාවේ දී තමා ජල මෝටර් දෙකක් අත්අඩංගුවට ගත් බව දන්වන ලදි.එසේම මෙම මෝටර් ආපසු ලබා දෙන්නේද නැද්ද යන්න ගොවි සංවිධාන වලින් විමසන ලදි. එහිදි එය ලබා දිම නොදිම පිළිබද විවිධ අදහස් දක්වන ලදි.කෙසේ වෙතත් තමා මෙම ජල පොම්ප ආපසු ලබා නොදන බවත් එම ක්‍රියාව නතර කිරිමට උපරිම ක්‍රියා මාර්ග ගන්නා බවද දන්වන ලදි.

දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ

ඉදිරි කන්නය පිළිබදව හා දේශිය වී වගාව පිළිබදව අදහස් දක්වන ලදි. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් වී මිලදී ගැනිම මෙවරද ක්‍රියාත්මක කළ බවත් දැන්වූ අතර ඉදිරි කන්නය සාර්ථක වේවායි ප්‍රාර්ථනා කරන ලදි.

අනතුරුව ප්‍රාදේශිය ලේකම් තුමාගේ මුලාසන කථාවෙන් හා නේවාසික ව්‍යාපාර කළමනාකාර මහතාගේ ස්තුති කථාවෙන් පසු රැස්වීමේ කටයුතු නිමාවට පත් විය.

..................................

එල්.ජේ.එම්.සී.බණ්ඩාර
දිස්ත්‍රික් ලේකම්
පුත්තලම

10/19

පිටපත්

01. අධ්‍යක්ෂ- වාරිමාර්ග කළමණාකරණ අංශය - කොළඹ - කා. දැ. ගැ. පි.
02. ප්‍රාදේශිය ලේකම් - නවගත්තේගම-කරුවලගස්වැව-ආනමඩුව-කොටවෙහෙර - කා. දැ. ගැ. පි
03. වාරිමාර්ග අධ්‍යක්ෂ(ජල කළමනාකරණ) වාරිමාර්ග දෙපාර්තමේන්තුව - එම
04. අධ්‍යක්ෂ- වාරිමාර්ග දෙපාර්තමේන්තුව - පුත්තලම - එම
05. සහකාර කොමසාරිස්(ගොවිජන සේවා) -හලාවත - එම
06. නියෝජ්‍ය අධ්‍යක්ෂ - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - එම
07. ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු- ඉගිනිමිටිය - එම